**නිපුණතාවය :-** ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :-** -ව්‍යවසායකත්ව සංකල්පය විග්‍රහ කරයි.

( පෙළ පොතේ පිටු අංක 17 සිට 19 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න)

(01) ව්‍යවසායකයා නවෝත්පාදනයේ යෙදෙන විට අවදානමකට මුහුණ දීමට සිදුවේ. අවදානම යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(02) අවදානම සහ ප්‍රතිලාභ අතර ඇති සම්බන්ධතාවය දක්වන්න.

(03) අනාගතය පිළිබඳ දැක්මක් ව්‍යවසායකයකුට වැදගත් වන්නේ ඇයි ?

(04) කාලීන උදාහරණයන් ඇසුරෙන් පරිසර සංවේදී බව තුළින් ව්‍යාපාරික අවස්ථාවන් හඳුනාගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(05) 'සුභවාදී බව' ව්‍යවසායකයකුට වැදගත්වන්නේ කෙසේ ද ?

(06) හිස් තැන් පුරවන්න

( අවිනිශ්චිතතාව / සාර්ථක / අනුලෝම / අසාර්ථක / ප්‍රතිලෝම / අනාගතයේ දී / වර්තමානයේ දී / පරිසර සංවේදී බව තුළින් ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම )

i. අවදානම යනු නව නිපයුම වෙළඳපලේ -------------------- වීම හෝ --------------------- වීමට ඇති ඉඩ කඩයි.

ii. අවදානම සහ ප්‍රතිලාභය අතර ඇත්තේ -------------------- සම්බන්ධතාවයකි.

iii. අවදානමට ප්‍රධානතම හේතුව ----------------------- යි.

iv. තමා සහ තම ක්ෂේත්‍රය ------------------ කුමන ස්ථානයකට පත්වේ ද යන්න --------------- මනසින් දැකීම අනාගත දැක්මයි.

v. කොරෝනා වසංගතයේ ආරම්භයත් සමග මුඛ ආවරණ විකිණීමේ ව්‍යාපාර අලුතින් ආරම්භවීමට බලපෑ ආසන්නතම ව්‍යවසායක ගුණාංගය වන්නේ ----------------------- ය.